1. දැනට සේවය කරන ආයතනය:——————————,
2. දැනට දරන තනතුර:——————————,
3. එම තනතුරට පත් වූ දිනය:——————————,
4. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:——————————,

13. ඔබ දැනටමත් මෙම සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :——————————,
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක යන වග ද:——————————,
එම තනතුරට පත් වූ දිනය:——————————,

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————,

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ෴*

.................................................................. මයා./මිය./මෙනවිය මෙම ආයතනයේ .................................. වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය:——————————,

05-235

---

# පළාත් පාලන නිවේදන

## බණ්ඩාරවෙල මහා නගර සභාව

### විදුලි සම්බන්ධතා නිර්දේශ ලබාදීම සඳහා ගාස්තු පැනවීම

බණ්ඩාරවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි විදුලි පාරිභෝගිකයන් හට අමතර විදුලි සම්බන්ධතා ගැනීමේ දී මහා නගර සභාවේ නිර්දේශය ලබාදීම පිණිස 2013.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් දෙසිය පනහක (රු.250ක) ගාස්තුවක් අයකිරීම සුදුසු බවට බණ්ඩාරවෙල මහා නගර සභාව විසින් තීරණය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. රන්දෙණිය,
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහා නගර සභාව.

2013 අප්‍රේල් මස 01 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

05-126

## පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොදු සුසාන භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් 2013.04.09 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක 09-01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරන්නීය.

එමල් ප්‍රියන්ත හේරත්,
සභාපති,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

යෝජනාව

සුසාන භූමි හා මිනිපිටි ආඥා පනතේ විධිවිධාන පරිදි හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පහත උපලේඛනයේ පළමු තීරුවේ සඳහන් සුසාන භූමි පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොදු සුසාන භූමියක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරන්නීය.

*උපලේඛනය*

පළමු තීරුව

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි වසම/ගම* | *පොදු සුසාන භූමියේ නම* | *පිඹුර/කැබලි අංකය අක්කර/රූඩ්/පර්චස්* |
|---|---|---|---|
| පඬුවස්නුවර නැගෙනහිර | 1379 කනෝගම/රදලියගොඩ | රදලියගොඩ පොදු සුසාන භූමිය | අගපි 23344/39/01/-/18 |
| පඬුවස්නුවර නැගෙනහිර | 1369 පාලාවිටිය/කහවිටිය | කහවිටිය පොදු සුසාන භූමිය | අගපි 2297/52/-/02/25 |
| පඬුවස්නුවර නැගෙනහිර | 1368 දූනුපත/ගල්කන්දයාය | ගල්කන්දයාය පොදු සුසාන භූමිය | අගපි 2215/02/-/01/10 |

05-294

---

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ එළහරක් මස් වෙළඳාම සඳහා කඩයක් පවත්වාගෙන යාම පිණිස 2013.04.01 වැනි දින සිට 2013.12.31 වැනි දින දක්වා වූ කාලයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බැවින්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් කුමන කරුණක් නිසාද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝ ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඕ. පී. රෝහණ බණ්ඩාර,
සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව,
රඹුක්පිටිය.

2013 අප්‍රේල් මස 19 වැනි දින,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *මස් වෙළඳාම කරනු ලබන ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| එස්. එච්. එම්. සිද්දික් | ඕවිට, ජයසුන්දර, නාවලපිටිය (ඕවිට, ජයසුන්දර, නාවලපිටිය මිනින්දෝරු ඥානප්‍රකාශම් මහතා සකස් කළ සැලසුම් අංක 8659, 8බී/3 ස්ථානය) | හරක් මස් වෙළඳාම |

05-127

# විවිධ දැන්වීම්

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

ජාතික පාරිසරික පනත යටතේ දැන්වීම - 2013

1980 වර්ෂයේ අංක 47 දරන ජාතික පාරිසරික අධිකාරිය 1980 වර්ෂයේ අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ද 1988 වර්ෂයේ අංක 56 දරන සංශෝධිත පනතේ විධිවිධානවලට ද යටත්ව මධ්‍යම පාරිසරික සභාපති විසින් අදාළ පනතේ 26 වැනි වගන්තියට අනුකූලව ද පවරන බලතලවල බලය පරිදි 2001 වර්ෂයේ සැප්තැම්බර් මස 01 වැනි දින සිට පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් බලතල ද රාජකාරි ද සේවාවන් ද ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත පැවරීම මත වවුනියාව උතුරු ප්‍රාදේශීය සභාවේ පරිපාලන බල සීමාව තුළ මෙම පනත ක්‍රියාත්මක කරන අතර, පහත දැක්වෙන උපලේඛනයේ දක්වා ඇති කර්මාන්ත සඳහා මධ්‍යම පාරිසරික අධිකාරිය මගින් නියම කරන ලද පරිදි පෝර්ම, ගාස්තු, පරීක්ෂා කිරීමේ ගාස්තු, හා බලපත්‍ර ගාස්තු යනාදිය නියම කර අයකරන බවට මෙයින් තීරණය කර නිවේදනය කරමි. මෙම නිවේදනය වනාහි මෙයින් අයකරනු ලබන ගාස්තු 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ නියම කර අය කරන බලපත්‍ර ගාස්තුවට අමතරව අතිරේක එකක් වන අතර, ඒවාට කිසිම අයුරකින් හානියක් ඇති නොවන එකක් වනු ඇත.

### උපලේඛනය

1. 25 දෙනෙකුට අඩු සේවක පිරිසක් සේවයේ යොදවා ඇති සබන්, කුණු ඉවත් කිරීමේ හෝ වෙනත් යම්කිසි පිරිසිදු කිරීමේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක්.
2. මෙට්‍රික් ටොන් 150ට අඩු සම්පූර්ණ ධාරිතාවයකින් යුත් විශාල පැටුල් ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම්.
3. දිනකට කිලෝග්‍රෑම් 100කට අඩු කිලෝග්‍රෑම් 50ට වැඩි නිෂ්පාදන ධාරිතාවයකින් යුත් දුම්ගැසූ රබර් තට්ටු නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය.
4. තනි නිෂ්පාදන පනතේ එක් ගොඩක පොල් කටු 10,000කට අඩු පොල්කටු 10,000කට වැඩි සම්පූර්ණ අභ්‍යන්තර මිලදී ගැනීම් සහිත පොල්කටු දැල්වීමේ කර්මාන්තය.
5. 25 දෙනෙකුට අඩු 10 දෙනෙකුට වැඩි සේවක පිරිසක් සේවයේ යොදවා ඇති ආයුර්වේද, ස්වදේශ, බෙහෙත් නිෂ්පාදන, සකස් කිරීම බෙදීම හෝ විධිමත් කිරීමේ කර්මාන්ත.
6. ඊයම් උණු කර අකුරු සකස් කිරීම හැර ඇති මුද්‍රණාල.
7. 10 දෙනෙකුට අඩු සේවක පිරිසක් යොදවා බතික් කර්මාන්තය.
8. 10 දෙනෙකුට අඩු සේවක පිරිසක් යොදවා ප්ලාස්ටික් අමු ද්‍රව්‍යයක් ලෙස පාවිච්චි කරන කර්මාන්ත.
9. 10 දෙනෙකුට අඩු සේවක පිරිසක් සේවයේ යොදවා ස්වාභාවික ද්‍රව්‍යමය දියකිරීම් ද්‍රව්‍ය යොදවා වියලි ඇපිල්ලීමේ - වාණිජමය ඇපිල්ලීම් හල්.
10. තෙත් ක්‍රියාකාරිත්වය ඇති කරන කසල රහිත හම් පදම් කිරීමේ කර්මාන්ත.
11. ස්වභාවික කොළ වර්ග මලානික තත්ත්වයට පත් නොකරන හෝ හානි ඇති නොකරන ක්‍රියාකාරිත්වයෙන් යුත් කොහු මෝල්. (කෙඳි)
12. 25කට අඩු පේෂ යන්ත්‍ර සහිත පේෂකර්මාන්තශාලා.
13. 10කට අඩු අත් යන්ත්‍ර සහිත විවීම් පේෂකර්මාන්තශාලා.
14. සීනි කර්මාන්තශාලාවක් හෝ සීනි පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථාන හැර උක් කර්මාන්ත ශාලා.
15. 25 දෙනෙකුට අඩු 5 දෙනෙකු ට වැඩි සේවක පිරිසක් යොදවා එළවළු, පළතුරු, මස්, මුහුදු මාළු හා කිරි පදම් කිරීමේ කර්මාන්ත ශාලා.
16. 25 දෙනෙකුට අඩු 10 දෙනෙකුට වැඩි සේවක පිරිසක් යොදවා පොල්තෙල් සිඳීමේ කර්මාන්ත.
17. 25 දෙනෙකුට අඩු 05 දෙනෙකුට වැඩි සේවක පිරිසක් යොදවා පාන් නිෂ්පාදනය, බිස්කට්, රසකැවිලි නිෂ්පාදනය කිරීමේ පාන් පෝරණු.
18. 25කට අඩු 10 දෙනෙකුට වැඩි සේවක පිරිසක් යොදවා මත්පැන් හැර බීම සකස් කිරීමේ කර්මාන්ත.
19. දැවෙන සෝඩා පාවිච්චි කර බෝතල් සේදීම හැර වෙනත් බෝතල් කිරීමේ මධ්‍යස්ථාන.
20. දිනකට කිලෝග්‍රෑම් 500 කට අඩු නිෂ්පාදන ධාරිතාවයකින් යුත් ශීතල ක්‍රියාකාරිත්වයෙන් යුත් වීමෝල්.
21. වියළි ගතියෙන් යුත් හාල් මෝල් (සීතල හෙවත් තෙත් ගතියෙන් තොර වෙනත් දෑ)
22. ඇඹරීමේ මෝල්.
23. 2500කට අඩු 50කට වැඩි කුකුළන් ඇති කුකුල් ගොවිපළවල්.
24. 50කට අඩු 05කට වැඩි ඌරන් ඇති ඌරු ගාලක්.
25. 50කට අඩු 10කට වැඩි සතුන් සිටින එළහරක් ගාලක්
26. දිනකට මෙට්‍රික් ටොන් 25කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් ඇති සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලා.
27. කිලෝ 300කට අඩු කිලෝ 100කට වැඩි සම්පූර්ණ නිෂ්පාදන තත්ත්වයක් ඇති ජලය හෝ සූර්ය හෝ සුළං බලය නොමැති විදුලි උත්පාදන කර්මාන්ත ශාලා.
28. දිනකට ඝන මීටර් 50කට අඩු නිෂ්පාදන බලයක් ඇති කොන්ක්‍රීට් මධ්‍යස්ථානයක්.
29. කොන්ක්‍රීට් අච්චු කර්මාන්ත ශාලාවක්.
30. යාන්ත්‍රික ක්‍රමගත කරන ලද සිමෙන්ති කණු සකස් කිරීමේ කර්මාන්ත.
31. මෙට්‍රික් ටොන් 20කට අඩු නිෂ්පාදන බලයක් ඇති හුණු පෝරණයක්.
32. 25 දෙනෙකුට අඩු සේවක පිරිසක් යොදවන ලද මැටි භාණ්ඩ කර්මාන්තශාලා.
33. උළු හා ගඩොල් පෝරණු.
34. අන් උපකරණ පාවිච්චි නොකර කැඩීමේ කටයුතු හැර දිනකට ඝන මීටර් 25කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් ඇති කළුගල් කැඩීමේ නැතහොත් පදම් කිරීමේ කර්මාන්ත.
35. දිනකට මෙට්‍රික් ටොන් 5කට අඩු අභ්‍යන්තර ධාරිතාවයක් ඇති පෝරණු.
36. බෙහෙත් නරක් නොවී ආරක්ෂා කිරීම හා සම්බන්ධ කර්මාන්ත.
37. දිනකට ඝන මීටර් 50කට අඩු ධාරිතාවයකින් යුත් ලී ඉරීමේ මෝල්.

38. අශ්වබල තුනකට (03) වැඩි බලය පාවිච්චි කරන වඩුවැඩ කර්මන්ත ශාලා.
39. කාමර 20කට අඩු සංචාරක නිවාස, අමුත්තන්ගේ නිවාස හා විශ්‍රාමශාලා.
40. 05 දෙනෙකුට වැඩි සේවක පිරිසක් සහිත ආහාර පිසීමේ පහසුකම් සහිත නැවතීමේ පහසුකම් නොමැති සංචාරක නිවාස.
41. 25කට වැඩි 200කට අඩු නැවතී සිටින අයට ආහාර හා නැවතීමේ පහසුකම් ලබාදිය හැකි නිවාස.
42. මාරු කිරීමේ වාරයකට 200කට අඩු පිරිසක් ද 10කට දෙනෙකුට වැඩි සේවක පිරිසක් ද සේවයේ යොදවා ඇති නිමකළ ඇඟලුම් කම්හලක්,
43. මාසයකට ඝන මීටර් 600කට අඩු නිෂ්පාදන ධාරිතාවක් ඇති බෝර තනි පිපිරවීමේ ක්‍රියාවලිය.
44. 25 කට අඩු සේවක පිරිසක් සේවයේ යොදවා, ලියවන පට්ටල් දියකර අලවන (වෑල්ඩින්) වැඩපොළවල් ඇතුළු යන්ත්‍ර සම්පාදනය කිරීමේ කර්මාන්තශාලා යන්ත්‍ර, යන්ත්‍ර උපකරණ නිෂ්පාදන හෝ ඒකාබද්ධ කිරීමේ කර්මාන්ත.
45. අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ ස්වයංක්‍රීය වායු (ගෑස්) යනාදිය කළ හැකි පහසුකම් සහිත වාහන අලුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීමේ වැනි කටයුතු කිරීමේ වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථාන.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/6

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදයේ) 3 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ දී 2013.01.22 වැනි දින පැවැති මහ සභා රැස්වීමේ දී සභා සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන තීරණ පළ කරනු ලැබේ.

***තීරණය***

"පළාත් පාලන, නිවාස ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබ 1988 වර්ෂයේ අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ(පළාත් පාලන) පළකරන ලද්දා වූ ද උතුරු නැගෙනහිර පළාතේ පිහිටා ඇති පළාත් පාලන ආයතනවලටද බල පවත්වන බවට ගරු උතුරු නැගෙනහිර ආණ්ඩුකාරතුමා විසින් පිළිගනු ලැබ 1994 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වන දින දරන අංක 842 ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ (පළාත් පාලන) පළ කරන ලද්දාවූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවේ I වැනි කොටසත් සම්මත අතුරු ව්‍යවස්ථා 11 වන කොටසේ සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථා 01 සිට 42 දක්වා ඇති අතුරු ව්‍යවස්ථා ද වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන පරිච්ඡේදයේ) 3 වැනි කොටසේ 1 වන උප වගන්තිය යටතේ පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තිය අනුව පිළිගන්නා බවට වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව මෙයින් තීරණය කර ගන්නා ලදී.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/1

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

**7(2) වැනි වගන්තිය යටතේ දැන්වීම - 2013**

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරන ලද බදුකරුවන් වෙත ලබාදෙන ලද ඕනෑම මස් කඩයක් ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 17(1) කොටස යටතේ මා වෙත පවරා ඇති බලතල අනුව අදාළ ලැයිස්තුව අනුව නියමිත දිනවලදීද රජය විසින්

නිවේදනය කරනු ලබන දිනවල දී ද මා විසින් වරින් වර දැනුම් දෙනු ලබන දිනවල දී ද සතුන් අලෙවි කිරීම ද අලෙවි කිරීම සඳහා එල්ලා තැබීම ද මස් අලෙවි කරන ස්ථාන විවෘතකර තැබීම ද සම්පූර්ණයෙන්ම තහනම් බව මෙයින් නිවේදනය කරමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

**උපලේඛනය**

1. ශ්‍රී ලංකා ජනරජයේ නිදහස් දිනය.
2. මහාසිව රාත්‍රි දිනය.
3. වෙසක් පූර්ණ පෝය දිනයන් (රජය විසින් නිවේදනය කරනු ලබන දිනයන්).
4. ලෝක සත්ත්ව දිනය.
5. මාසේ පෝය දිනය.

05-131/2

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

කසළ පවිත්‍ර කිරීමේ පනත (126 වැනි පරිච්ඡේදය) යටතේ දැන්වීම - 2013

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ පවරා ඇති බලතල අනුව අංක 1024 හා 1998.04.17 වන දින පිළිගන්නා ලද 520/7 දරන අංකයෙන් හා 1988.08.23 වන දින දරන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ "කසල පවිත්‍ර කිරීමේ සේවය" දරිද්‍රතාවය මත ප්‍රාදේශීය සභාවෙන් ඉවත් කරන ලද පදිංචිකරුවෙකු හැර ඕනෑම නිවසක පදිංචිකරුවන් ප්‍රාදේශීය සභාවෙන් නියම කරනු ලබන එවැනි පවිත්‍ර කිරීමේ ගාස්තුව ප්‍රාදේශීය සභාවට මාසිකව ගෙවිය යුතුය. ඒ අනුව කසල ඉවත් කරන නිවෙසක් වෙනුවෙන් මාසිකව රුපියල් 60 ගාස්තුව වශයෙන් අය කරන බවට මෙයින් නිවේදනය කරමි.

| | |
|---|---|
| කඩ, තේපැන්හල්වල කසල ප්‍රමාණය අනුව | රුපියල් 200 0 සිට රුපියල් 1,800 0 |
| රජයේ පෞද්ගලික ආයතනවලට මාසිකව | රුපියල් 200 0 සිට රුපියල් 1,800 0 |
| හෝටල් මට්ටමේ භෝජනාගාර මාසිකව | රුපියල් 1,800 0 සිට රුපියල් 3,000 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/9

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (272 වැනි පරිච්ඡේදය) - 2013

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, ඇති කරනු ලබන සුනඛයින්, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදය) 4 වන වගන්තිය යටතේ 2013 වර්ෂයේ ලියාපදිංචි ගාස්තුව පිරිමි හෝ ගැහැණු හෝ කවර වර්ගයක වුවද එක් බල්ලෙකු වෙනුවෙන් රුපියල් 50 ලෙස නියම කර ඇත. මෙම ගාස්තු ගෙවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/5

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### දැන්වීම් පළකිරීමේ ගාස්තුව - 2013

1987 ප්‍රාදේශීය සභා ආඥාපනතේ 126-ඊ වගන්තිය යටතේ පවරා ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වන දින දරන 520/7 *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස ඉදිකිරීම් ඇමැතිතුමා විසින් ප්‍රසිද්ධ කරන ලද කරුණු අංක 1024 හා 1998.04.17 දින දරන ශ්‍රී ලංකාවේ *ගැසට් පත්‍රය* මගින් එහි (62/ඒ, 63/ඒ,64/ඒ) යන පිටුවල පළකරනු ලැබ එමගින් මා විසින් පිළිගනු ලැබූ වෙළඳ දැන්වීම් සම්බන්ධයෙන් උපවගන්තියේ විධිවිධාන අනුව වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ කිසිවකු විසින් යම්කිසි මාවතක නැතහොත් මාර්ගයේ හෝ මාර්ගයට දික්ගැස්සෙන පරිදි දැන්වීමක් නැතහොත් මාර්ගයේ සිට බලන විට දර්ශනය වන පරිදි සවිකර ඇති බෝඩ් ලැල්ල හෝ වෙනත් තාවකාලිකව ඉදිකර ඇති නැතහොත් කුමන ආකාරයේ හෝ අලංකාර කිරීමක් හෝ ඉදිකිරීමක් නැතහොත් ඉදිකිරීමට සැලසුම් කිරීමක් සම්බන්ධයෙන් වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවෙන් බලපත්‍රයක් ලබාගත යුතුය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන උපලේඛනය අනුව දැන්වීම් ගාස්තු අයකිරීමට තීරණය කර ඇති බව මෙයින් ප්‍රසිද්ධ කරමි. මෙසේ ඉදිකරන ස්ථිර දැන්වීම් වර්ෂයක් පාසා අදාළ ගාස්තුව ගෙවා අලුත් කර ගත යුතු බව ද මෙයින් දන්වා සිටිමි.

| | | රු. ශත |
|---|---|---|
| 1. | තාප්පයක හෝ නාම පුවරුවක දර්ශන සඳහා තබන ස්ථිර ප්‍රසිද්ධ කිරීමේ දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම වර්ෂයකට හෝ එක් කොටසකට (නාම පුවරුවක දෙපැත්තේම දැන්වීම් දර්ශනය සඳහා තැබීමේදී දෙපැත්තටම ගාස්තු අය කළ යුතුය.) | 50 0 |
| 2. | බැනරයකින් දර්ශනය සඳහා තබනු ලබන තාවකාලික දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම මාසයකට හෝ කොටසකට | 25 0 |
| 3. | ලැල්ලක හෝ යමක ආධාරයෙන් දර්ශණය සඳහා තබන ආලෝකය සහිතව තබන විදුලි පහනක් සහිත දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම වර්ෂයක් සඳහා හෝ එහි කොටසකට | 75 0 |
| 4. | ස්ථිර වෙළඳ පොළවල්වල දැන්වීම් සහිත නාම පුවරු - වර්ග අඩියකට | 50 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/3

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### ගොඩනැගිලි බලපත්‍ර - 2013

ප්‍රාදේශීය සභා පරිපාලන සීමාවට ඇතුලත් ස්ථාන සියල්ලක්ම 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වැනි වගන්තියේ සිට 59 වන වගන්තිය දක්වා ද ඒ සමගම නිවාස ඉදිකිරීම් සංවර්ධන ආඥා පනතේ 600 වන පරිච්ඡේදය) විධිවිධාන ද 1998.01.01 වන දින සිට අපගේ ප්‍රාදේශීය සභාවට ද බලපවත්වන පරිදි ක්‍රියාත්මක වීමට යටත්ව මා හට ඇති බලතල හා බලය අනුව ද 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතලවලට ද යටත්ව සභාවේ පරිපාලන සීමාව තුළ නිවසක් ඉදිකිරීමට හෝ යම් කිසිවක් ඉදිකිරීමට ගොඩනැගිලි ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමේ දී එහි පරීක්ෂා කිරීම් හා වෙනත් කරුණු සම්බන්ධයෙන් ද උපලේඛනයේ සඳහන් පරිදි 2013.01.01 වන දින සිට ගාස්තු අයකරන බවට මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

### උපලේඛනය

| *අංකය* | *විස්තර* | *2013 වර්ෂය සඳහා අයකිරීම්* රු. ශත |
|---|---|---|
| 01. | පදිංචි ස්ථානයට තාප්පයක් ඉදිකිරීම | 350 0 |
| 02. | වෙළඳ කටයුතු සඳහා තාප්පයක් බැඳීම | 750 0 |
| 03. | වර්ග අඩි 500කට නොවැඩි බිම් ප්‍රමාණයේ පදිංචි නිවසක් ඉදිකිරීම | 325 0 |
| 04. | වර්ග අඩි 500කට නොවැඩි බිම් ප්‍රමාණයේ වෙළඳ ගොඩනැගිල්ලක් | 525 0 |
| 05. | වර්ග අඩි 500ට වැඩි වර්ග අඩි 1500ට අඩු බිම් ප්‍රමාණයේ පදිංචියට නිවසක් ඉදිකිරීම | 450 0 |
| 06. | වර්ග අඩි 500ට වැඩි වර්ග අඩි 1500 වැඩි නොවූ බිම් ප්‍රමාණයේ වෙළඳ ගොඩනැගිල්ලක් සඳහා | 650 0 |
| 07. | වර්ග අඩි 1500ට වැඩි වර්ග අඩි 2500 බිම් ප්‍රමාණයේ පදිංචියට නිවසක් ඉදිකිරීම් | 600 0 |
| 08. | වර්ග අඩි 1500ට වැඩි වර්ග අඩි 2500ක බිම් ප්‍රමාණයේ වෙළඳ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට | 800 0 |
| 09. | වර්ග අඩි 2500ට වැඩි බිම් ප්‍රමාණයෙන් යුත් පදිංචි නිවසක් සඳහා සෑම වර්ග අඩි අඩි 1000කට හෝ ඉන් කොටසකට | 250 0 |

| අංකය | විස්තර | 2013 වර්ෂය සඳහා අයකිරීම් රු. ශත |
|---|---|---|
| 10. | වර්ග අඩි 2500ට වැඩි බිම් ප්‍රමාණයකින් යුත් වාණිජ ගොඩනැගිල්ලක සෑම වර්ග අඩි 1000කට හෝ ඉන් කොටසකට | 450 0 |
| 11. | ගොඩනැගිල්ලේ වෙනස් කළ යුතු එහෙත් බිම් ප්‍රමාණය වැඩි නොවන පදිංචිය සඳහා වූ ගොඩනැගිලිවලට | 250 0 |
| 12. | ගොඩනැගිල්ලේ වෙනසක් කළ යුතු එහෙත් බිම් ප්‍රමාණය වැඩි නොවන වාණිජ කටයුතු සඳහා ගොඩනැගිලිවලට | 450 0 |
| 13. | පදිංචි නිවසක් ඉදිකිරීමේ ගොඩනැගිලි ඉල්ලුම්පතක් අනුමත කරනු ලැබ නියමිත කාලයේ දී ඉදිකිරීම් අවසන් නොකොට යළිත් අලුත් කිරීමේ ගාස්තුව වර්ෂයකට | 175 0 |
| 14. | වාණිජමය ගොඩනැගිල්ලක් සඳහා වන ඉල්ලුම්පත අනුමත කරනු ලැබ නියමිත කාලය තුළ ඉදිකිරීම් සම්පූර්ණ නොකර අලුත් කිරීමට වර්ෂයකට | 375 0 |
| 15. | පදිංචිවීමේ ගොඩනැගිල්ලේ වැඩ නිම වී පදිංචි සහතිකයක් ඉල්ලන්නේ නම් ඒ සඳහා ගාස්තුව | 175 0 |
| 16. | වාණිජමය ගොඩනැගිල්ලක් ඉදිකර පදිංචිවීමේ සහතිකයක් ඉල්ලීමේ දී ගාස්තුව | 375 0 |
| 17. | ගොඩනැගිලි ඉල්ලුම්පත් ගාස්තුව | 200 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව,
නෙඩුන්කේණි,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05—131/4

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### බලපත්‍ර ගාස්තු අය කිරීම - 2013 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147,148,149,150(1), (2), 151, 152(1),(2), 153(1), 154(1) යන වගන්ති යටතේ 2013 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2013 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා පහත සඳහන් උපලේඛනයේ ඇති පරිදි බලපත්‍ර ගාස්තුව, කර්මාන්ත පිළිබඳ බදු අයකරන බවට 2012.12.20 වන දින දරන අංක :04 තීරණය මගින් සභා සම්මත කර ඇත. බලපත්‍ර ගාස්තු සියල්ලමක් ලේඛනයේ සඳහන් පරිදි 2013.03.31 වන දිනට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව,
නෙඩුන්කේනි,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අංකය | වෙළඳාමේ විස්තර | 2013 වර්ෂය සඳහා අයකිරීම රු. ශත |
|---|---|---|
| 01. | "ඒ " වර්ගයේ තේ කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 02. | "බී" වර්ගයේ තේ කඩයක් පවත්වාගෙන යාම | 800 0 |
| 03. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 04. | තේ කඩයක් හා භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 05. | බේකරියක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 06. | කොණ්ඩා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 07. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 450 0 |
| 08. | හරක් මස් කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 09. | අලුත් මාළු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 10. | සමුපාකාරයේ අලෙවි සලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 11. | එළු මස් කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 12. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම - (ඒ වර්ගයේ) | 1,000 0 |
| 13. | බී වර්ගයේ සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 500 0 |
| 14. | සිසිල්බීම කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 15. | යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 16. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි සලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 17. | සිමෙන්ති පැකට් 20කට වඩා තබා අලෙවි කිරීම | 1,000 0 |
| 18. | දැව ගබඩාවක් හෝ දැව විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 19. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |

| *අංකය* | *වෙළඳාමේ විස්තර* | *2013 වර්ෂය සඳහා අයකිරීම රු. ශත* |
|---|---|---|
| 20. | ගෘහ භාණ්ඩ අලෙවි කිරීම | 1,000 0 |
| 21. | දර ගබඩාවක් පවත්වාගෙන යාම | 550 0 |
| 22. | එළවළු කඩයක් පවත්වාගෙන යාම | 350 0 |
| 23. | පොල් ගෙඩි 1,000කට වඩා තබා අලෙවි කිරීම | 1,000 0 |
| 24. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හා අලුත්වැඩියා කිරීම | 1,000 0 |
| 25. | ගබඩාකර තබා වෙළඳාම් කිරීම | 500 0 |
| 26. | මත්පැන් හලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 27. | කඩල වෙළඳ සලක් පවත්වාගෙන යාම | 300 0 |
| 28. | පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 29. | පාපැදි අමතර කොටස් අලෙවි කිරීම | 1,000 0 |
| 30. | රූපවාහිණී හා ගුවන් විදුලි අලුත්වැඩියා කිරීම | 1,000 0 |
| 31. | කම්හලක් හා වැඩපොලක් පවත්වාගෙන යාම | 850 0 |
| 32. | සාමාන්‍ය කම්හලක් පවත්වාගෙන යාම | 400 0 |
| 33. | කොහු ලණු හෝ කෙදි නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 |
| 34. | රා එකතු කිරීමේ හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 35. | වෑල්ඩින් ගරාජයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 36. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 37. | බැටරි චාජ් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 38. | කුෂන් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 39. | රූපවාහිණී, ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 40. | ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 |
| 41. | නව යතුරු පැදි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 42. | පැට්‍රල්, භූමිතෙල්, ඩීසල් අලෙවි කිරීමේ ඉන්ධන හල් පවත්වාගෙන යාම | 3,000 0 |
| 43. | පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 44. | රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 45. | පේෂ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 46. | කෘත්‍රිම රසායන පොහොර තබා ගැනීම | 1,000 0 |
| 47. | කෘමිනාශක බෙහෙත් ද්‍රව්‍ය තබා අලෙවි කිරීම | 1,000 0 |
| 48. | පාවහන් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 49. | පෙයින්ට්, වානිෂ්, ඩිස්ටෙන්සර් තබා වෙළඳාම් කිරීම | 1,000 0 |
| 50. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 51. | යන්ත්‍රයකින් මිරිස් හා වෙනත් ධාන්‍ය වර්ග ඇඹරීමේ මෝලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 52. | ඒ වර්ගයේ හාල් මෝලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 53. | බී වර්ගයේ හාල් මෝලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 54. | කුකුලන් 100කට වැඩි කුකුල් ගොවිපොලක් පවත්වාගෙන යාම | 600 0 |
| 55. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 56. | පටිගත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 800 0 |
| 57. | පොත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පත්වාගෙන යාම | 750 0 |
| 58. | රූපවාහිනී, වීඩියෝ කැසට් කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 59. | ඇවිදිමින් වෙළඳාම් කිරීම | 300 0 |
| 60. | කොන්ක්‍රීට් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 61. | ෆැන්සි කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 62. | කුකුල් කෑම අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 63. | ධාන්‍ය වර්ග අලෙවි කිරීම | 750 0 |
| 64. | ගඩොල් නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 750 0 |
| 65. | සිමෙන්ති මල් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 66. | කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය කිරීම | 1,000 0 |
| 67. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 68. | තලතෙල් වක්කර ඇසිරීමේ මධ්‍යස්ථානයක් | 600 0 |
| 69. | ගෑස් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 70. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 71. | ඇඳුම් මැසීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 72. | ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 73. | යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 74. | හුණු පෝරණුවක් පවත්වාගෙනයාම | 350 0 |
| 75. | හුණු පැකට් කිරීම හා අලෙවි කිරීම | 750 0 |
| 76. | ස්වර්ණාභරණ ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 77. | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ මධ්‍යස්ථානයක් පත්වාගෙන යාම | 1,000 0 |
| 78. | ගල්වලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 79. | ගල් කැඩීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 80. | කලුගල් පාරිභෝගික භාණ්ඩ නිපදවීම හා අලෙවි කිරීම | 1,000 0 |
| 81. | දුරකථන පණිවුඩ හුවමාරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |

| අංකය | වෙළඳාමේ විස්තර | 2013 වර්ෂය සඳහා අය කිරීම රු. ශත |
|---|---|---|
| 82. | නැවතීමේ පහසුකම් සහිත නවාතැනක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 83. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය හා අලෙවි කිරීම | 1,000 0 |
| 84. | ටොපි නිෂ්පාදනය කර අලෙවි කිරීම | 1,000 0 |
| 85. | මික්ෂර් නිෂ්පාදනය කර අලෙවි කිරීම | 1,000 0 |
| 86. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 87. | සබන් නිශ්පාදනය කිරීම හා අලෙවි කිරීම | 500 0 |
| 88. | අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කිරීම | 1,000 0 |
| 89. | ඇඳුම්වලට බතික් දැමීම | 500 0 |
| 90. | දුම්කොළ පදම් කිරීම | 500 0 |
| 91. | අභ්‍යාස පොත් අපනයනය කිරීම | 1,000 0 |
| 92. | අභ්‍යාස පොත් බැඳීමේ මධ්‍යස්ථානයක් | 750 0 |
| 93. | කුකුල්මස් කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 94. | විවාහ පොරොන්දම් හෙවත් මඟුල් කපුකම් සේවය | 1,000 0 |
| 95. | ගොඩනැගිලි ප්ලෑන් අඳින්නා | 1,000 0 |
| 96. | ගොඩනැගිලිවලට වයරින් කිරීමේ සේවාව | 1,000 0 |
| 97. | වාහන සර්විස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 98. | ගවගාලක් පවත්වාගෙන යාම | 750 0 |
| 99. | ඉලෙක්ට්‍රොනික් මෝටර් - රී වයරින් කිරීම - කොයිල් | 1,000 0 |
| 100. | ඉන්ටනෙට් පරිගණක පන්ති පැවැත්වීම | 1,000 0 |
| 101. | පෞද්ගලික අධ්‍යාපන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 102. | සී. ඩී. කැසට් අලෙවි කිරීම | 1,000 0 |
| 103. | බුලත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 |
| 104. | මෝටර් රථ අලෙවි කිරීම | 1,000 0 |
| 105. | ටයර් ටියුබ් අලෙවි කිරීම | 750 0 |
| 106. | වියන ලද පොල් අතු අලෙවි කිරීම | 400 0 |
| 107. | පෞද්ගලික කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 108. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 109. | මෝටර් රථ අමතර කොටස් අලෙවි මධ්‍යස්ථානයක් | 1,000 0 |
| 110. | නෙට් කැෆේ | 750 0 |
| 111. | ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ගේ මධ්‍යස්ථානයක් | 1,000 0 |
| 112. | සුරතල් සතුන්ගේ මධ්‍යස්ථානයක් | 500 0 |
| 113. | විශාල රෙදි කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 114. | ගවයින් 10 දෙනෙකුට වැඩි ගවගාලක් පවත්වාගෙන යාම | 100 0 |
| 115. | මැටි භාණ්ඩ නිෂ්පාදන අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 116. | සිල්ලර බඩු අලෙවි මධ්‍යස්ථානයක් - ශ්‍රී | 1,000 0 |
| 117. | සිල්ලර බඩු අලෙවි සැලක් - ඩී | 800 0 |
| 118. | සිල්ලර බඩු අලෙවි සැලක් - ඌ | 650 0 |
| 119. | සිල්ලර බඩු සුළු වෙළඳාම | 500 0 |
| 120. | ජංගම භාණ්ඩ අලෙවිය (පාපැදියෙන්, ඇවිදිමින්, කුඩා කරත්තවලින්) | 500 0 |
| 121. | ජංගම භාණ්ඩවලට හිමි වෙළඳාම (කුඩා කරත්ත හැර, වෑන් වැනි වෙනත් රථ) | 1,000 0 |
| 121. | දුරකථන ට්‍රාන්ස්පෝමර් කණු (ටවර් කණු) | 50,000 0 |
| 123. | ත්‍රි රෝද රථ | 3,000 0 |
| 124. | බැංකු සේවා බලපත්‍ර (සෑම වෙන වෙන සේවාවන් සඳහා) | 3,000 0 |
| 125. | පදික වේදිකාවේ දිනක වෙළඳාම් කිරීමේ බලපත්‍ර ගාස්තුව | 250 0 |
| 126. | උත්සව කාලවල විශේෂ බලපත්‍ර ගාස්තු : කුඩා වෙළඳාම | 250 0 |
| | අයිස්ක්‍රීම් කඩ | 1,000 0 |
| | අයිස්ක්‍රීම් වෑන් | 1,000 0 |
| | රටකජු කඩ | 1,000 0 |
| | ලෝහ භාණ්ඩ අලෙවි සල | 1,000 0 |
| | රූපාලංකාර භාණ්ඩ සල් | 1,000 0 |
| | භෝජනාගාරයක් | 1,000 0 |
| | තල්ලුකරන කරත්තයේ වෙළඳාම | 500 0 |
| | පාපැදියේ වෙළඳාම | 500 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේනි,
වවුනියාව.
2013 ජනවාරි මස 3 වැනි දින,

05-131/7

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

පළාත් පාලන ආයතනවල ප්‍රතිසංවිධාන චක්‍රලේඛය අනුව දුරකථන කණුවල අයකිරීම් දැන්වීම - 2013

වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ සියළුම මාර්ග අයින්වල පිහිටුවා ඇති දුරකථන කණු සියල්ලටම අයකළ යුතු වෙළඳ අයකිරීම් ගාස්තුව අයකිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ප්‍රතිසංවිධාන චක්‍රලේඛයේ උපලේඛනයේ 1 හි යෝජනා හා අනෙකුත් නිර්දේශ යන කොටසේ මූල්‍ය කළමණාකරණය හා ආදායම් යන උප ශීර්ෂය යටතේ අංක 6.5 කොටසේ දෙන ලද කොන්දේසිවලට යටත්ව දුරකථන කණුවලට වෙළඳ අයකිරීම් බදු - පිරිවැටුම් බදු අයකිරීමට පසුගිය 2013.01.22 වැනි දින පැවැත්වුණු සභාවේ විශේෂ රැස්වීමේදී අංක 12 දරන තීරණය සහා සම්මත කර ගන්නා ලදී. පහත උපලේඛනයේ සඳහන් පරිදි දුරකථන කණුවලට බදු 2013.01.01 වැනි දින සිට වවුනියාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරමි.

| *අංක* | *ස්වභාවය* | *අයකිරීම රු. ශත* |
|---|---|---|
| 01. | අඩි 24 උස දුරකථන කණුවකට වර්ෂයකට එක් වතාවක් පමණක් | 120 0 |
| 02. | අඩි 24කින් යුක්ත දුරකථන කණු නිර්මාණය පිළිබඳ පරීක්ෂා කිරීමේ ගාස්තුව (ආරම්භක මුදල) | 150 0 |

එම්. බාලසුබ්‍රමණියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/8

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

දේපොල බදු පනවා අයකිරීම

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනෙත් 134(1) (2) (3) වගන්ති යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම් තුළ ගම් මෙම වර්ෂයේ ලබා ඇති සංවර්ධනය අනුව හඳුනාගෙන ඊළඟ වර්ෂවලදී දේපොළ බදු අය කිරීමට පූර්ව සූදානම් කටයුතු කළ යුතු බවට තීරණය කරන ලදී.

නෙඩුන්කේණි උතුර
නෙඩුන්කේණි දකුණ
කනගරායන්කුලම් උතුර
කනගරායන්කුලම් දකුණ
පුලියන්කුලම් උතුර
පුලියන්කුලම් දකුණ
මදියා මඩු
නයිනාමඩු

එම්. බාලසුබ්‍රමණියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/10

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109(ඇ) වගන්තිය යටතේ දැන්වීම - 2013

නළ ලිං සඳහා සේවා ගාස්තු අයකිරීම.- වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සියළුම නළ ලිං සම්බන්ධයෙන් නළ ළිඳ පාවිච්චි කරන පාරිභෝගික පවුලකින් මාසිකව රුපියල් 20 සේවා ගාස්තුවක් 2013.01.01 වන දින සිට අයකරන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109(ඇ) යටතේ මෙයින් නිවේදනය කරමි.

එම්. බාලසුබ්‍රමණියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

05-131/11

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (4) ලේඛනය අනුව වාහන පිළිබඳ බදු දැන්වීම - 2013

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 148 (4) වැනි ලේඛනයේ සඳහන් පරිදි වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ 2013 ජනවාරි

මස 01 වැනි දින සිට 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වාහන නවතා තැබීමේ ගාස්තුව පහත සඳහන් පරිදි අයකරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

**උපලේඛනය**

| *අංක* | *ස්වභාවය* | *2013 වර්ෂය සඳහා අයකිරීම රු. ශත* |
|---|---|---|
| 01. | සෑම ගොන් කරත්තයකටම - මාසිකව | 100 0 |
| 02. | සෑම අත් කරත්තයකටම - මාසිකව | 100 0 |
| 03. | පාපැදි නවත්වා තැබීමේ ස්ථානය - මාසිකව | 600 0 |
| 04. | රෝද දෙකේ ට්‍රැක්ටර් නවතා තැබීමට - වාර්ෂිකව | 600 0 |
| 05. | රෝද හතරේ ට්‍රැක්ටර් නවතා තැබීම | 600 0 |

05-131/12

---

**වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව**

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(4) වන ලේඛනය අනුව වාහන හා සම්බන්ධ බදු පිළිබඳ දැන්වීම - 2013

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(4) ලේඛනයේ සඳහන් පරිදි 2013 ජනවාරි මස 01 වැනි දින සිට 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා පාපැදි බලපත්‍ර ගාස්තුව රුපියල් 20 ලෙස අයකරන බවට 2012.12.22 වැනි දින දරන රැස්වීමේ තීරණ අංක 04 සභා සම්මත කර ගන්නා ලදී. ඒ අනුව අදාළ පරිදි එම ගාස්තුව අයකරණ බව මෙයින් දැනුම් දෙමි.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි,
වවුනියාව.

**උපලේඛනය**

| *අංකය* | *ස්වභාවය* | *2013 වර්ෂය සඳහා අයකිරීම රු. ශත* |
|---|---|---|
| 01. | සෑම පාපැදියකටම වාර්ෂිකව බලපත්‍ර ගාස්තුව | 20 0 |

05-131/13

---

**වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව**

නිදැල්ලේ යන ගවයින් පාලනය කිරීම - 2013 වර්ෂය

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වන වගන්තිය යටතේ වවුනියාව උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රධාන මාර්ගවල සැරිසරන නිදැල්ලේ යන ගවයින් පාලනය කිරීමට 2012.12.22 වැනි දින මහා සභා රැස්වීමේදී 13 වන තීරණය යටතේ පහත සඳහන් පරිදි සභා සම්මත කර ගන්නා ලදී.

ප්‍රධාන මාර්ගය ඇතුලත් නගර ප්‍රදේශයේ දහවල් හා රාත්‍රී කාලයේ නිදැල්ලේ යන ගවයින් තහනම් කිරීමට ලක්කර ඇත. අනෙකුත් මාර්ගවල රාත්‍රී කාලයේ සැරිසැරීම තහනම් කර ඇත.

නිදැල්ලේ යන ගවයින් වශයෙන් අල්ලාගනු ලබන එක් එක් ගවයාට දඩ වශයෙන් රුපියල් 1000ක් ද කුඩා සතුන් හට රුපියල් 500ක් ද නඩත්තු කිරීමේ වියදම ලෙස දිනකට රුපියල් 200ක් අයකරනු ලැබේ.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-131/14

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### ස්ථාන තෝරා ගැනීම

වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පහත සඳහන් ස්ථාන පදික වේදිකා වෙළෙඳාම් කිරීම සඳහා උචිත බවට 2013.01.22 වැනි දින රැස්වීමේදී අංක 02 දරන තීරණය යටතේ සභා සම්මත කරගන්නා ලදී.

*ජංගම හා සතියකට ඇතුළත් වෙළෙඳ කටයුතු සඳහා :*

නෙඩුන්කේණි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සිට නව බස් නැවතුම්පොළ,

කනගරායන්කුලම් : කනගරායන්කුලම් එළවළු වෙළෙඳපොල අසල

පුලියන්කුලම් : පුලියන්කුලම් එළවළු වෙළෙඳපොලේ ඉඩම.

*වාහන නවතා තැබීම :*

නෙඩුන්කේණි ඔට්ටුසුට්ටාන් හන්දිය

නෙඩුන්කේණි බස් නැවතුම් පොළ එළවළු වෙළෙඳ පොළේ ඉදිරිපස.

පුලියන්කුලම හන්දිය

කනගරායන්කුලම් හන්දිය, කනගරායන්කුලම් වෙළෙඳ පොළේ ඉදිරිපස කොටස

*ඝන කසල වැළලීමේ ස්ථාන :*

සූඩුවෙන්දාන් - පෙරියමඩු සූඩුවෙන්දාන් මාර්ගයේ සිට කිලෝ මීටර් 2කට ඈතින්.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-131/15

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මළ ඉවත් කිරීම පිළිබඳ දැන්වීම - 2013

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 95 දරන ලේඛනයේ ඇතුළත් පරිදි මාහට පවරා ඇති බලතල හා බලය අනුව වවුනියාව උතුර ප්‍රාදේශීය සභා සීමාව තුළ වූ පරිපාලන ප්‍රදේශය තුළ තිබෙන නිවෙස්, ආයතනවල වැසිකිළිවල අපද්‍රව්‍ය අපගේ වාහන වන කලිඑම්රියර් මගින් ඉවත් කිරීම සම්බන්ධයෙන් ගාස්තුවක් 2013.01.01 වන දින සිට පහත සඳහන් පරිදි අයකිරීමට 2012.12.22 වන දින අංක 12 දරන තීරණය සභා සම්මත කර ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති බව මෙයින් නිවේදනය කරමි.

| *අංකය* | *ස්වභාවය* | *අයකිරීම රු. ශත* |
|---|---|---|
| 01. | කලිඑම්රියර් මගින් මළ ඉවත් කිරීම - ගාස්තුව පරිපාලන සීමාව තුළ | 8,500 0 |

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-131/16

---

## වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව

### ස්ථාන සීමා කිරීම - 2013

වවුනියාව උතුර ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ එළවළු හා මාළු වෙළෙඳපොළවල් දැනට ලබාදීම මත, වෙළෙඳපොළේ සිට කිලෝමීටර් 2ක වටාපිටාව තුළ එළවළු, මාළු වෙළෙඳාම් කිරීම තහනම් කරන බවට 2012.12.22 වැනි දින රැස්වීමේ දී 7 වැනි තීරණය මගින් සභා සම්මත කරගන්නා ලදී.

එම්. බාලසුබ්‍රමනියම්,
සභාපති,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 31 වැනි දින,
නෙඩුන්කේනි,
වවුනියාව,
වවුනියාව උතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-131/17

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.